# උත්සාහවන්ත මිනිසා



අමාෂා රුවින්දි කුමාරගේ

# උත්සාහවන්ත මිනිසා

කතෘගේ නම : අමාෂා රුවින්දි කුමාරගේ

පළමු මුද්‍රණය :2024

මහමායා බාලිකා විදුහල
මහනුවර

කෘතිය පළ කරන දිනය : 2025-02-08

IBSN අංකය : 978-624-208-358-2

# පිදුම

මා ලියන දෑ විමසමින් උනන්දු කරවමින් ගුරු හරුකම්
ලබා දෙමින් නිතරම මා සමඟ රැදෙමින්
උපදෙස් ලබා දුන් භද්‍රා අතාවුද ගුරුතුමිය හා
සමන්මලී ගුරුතුමිය හා සෙනෙවිරත්න ගුරුතුමාද ඇතුලුව
මහාමායා ප්‍රාථමික විද්‍යාලයේ ගුරු මණ්ඩලයටද මාගේ
පාසලේ සහෝදරියන් හටද මාගේ ආදරණීය
දෙමාපියන්ටද
සෙනෙහසින් ආදරයෙන් පිළිගන්වමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.
ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණි"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.
මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# උත්සාහවන්ත මිනිසා

එකෝමත් එක කාලෙක ගැමි පවුලක් සිටියා. ඒ ගෙදර තමයි ඒ මුළු පළාතේම තිබුණු දුප්පත්ම ගම සහ දුප්පත්ම ගැමි පවුල.

ඒ පවුලේ ගමරාළ, ගම හාමිනේ, ගම පුතා සහ ගම දුව කියලා හතර දෙනෙක් ජීවත් වුණා. ගම පුතා හරිම දඩබ්බර සහ නුවණ නැති පුතෙක්. ගම දුව හරිම අහිංසක සහ නුවණක්කාර දුවෙක්. ගම පුතා කරන්නෙම මහ විසේකාර වැඩ. ගම දුව එහෙම නෙවෙයි, හැමවෙලේම අම්මා කියන දේවල් විතරයි කරන්නේ, ඇය හැමදාම මොළේ පාවිච්චි කරලා වැඩ කරන්නේ,

ගම දුව හැමදාමත් දවස් පහේම පාසල් ගියා ගමන පුතා දවස් පහෙන් දවස් තුනයි පාසල් යන්නේ. ඒ කියන්නේ සඳුදයි අඟහරුවාදැයි බදාදයි විතරයි, අනිත් දවස් දෙකේම අම්මා නැගිටින්න කියද්දී බොරු ලෙඩක් දාගෙන නිදාගන්නවා, ගම දුව පාසල් යද්දී ගම පුතා කාමරයේ දොරෙන් හොරෙන් එබී බලනවා, හැමදාම ඔය විසේකාර වැඩේ කරනවාමයි.

එක දවසක් ගම පුතා කරපු වැඩක් තමයි,
ගම දුව පාසල් ගියාට පස්සේ තාත්තයි අම්මයි කුඹුරේ වැඩ කරන අතරේ ගම පුතා හොරෙන් කාමරයෙන් එලියට ඇවිල්ලා එහා පැත්තේ ගෙදර මාමාගේ අඹ ගහෙන් අඹ ගෙඩි කඩන්න ගියා.

එහා ගෙදර මාමා ගමරාළගේ පවුල සමග තරහයි. ඒ තරහට ඒ පවුලේ ඉන්න අය මෙහෙට එනවට කැමති නෑ ගම පුතා අඹ කඩනවා දැකලා මාමාට හොඳටම තරහ ගියා.



ඊට පස්සේ ඉරටු කූරක් අරගෙන කුස්සියේ පැත්තේ දොරෙන් ඇවිල්ලා ගම පුතාට හොඳටම ගහලා තමන්ගේ නිවසින් එළවා ගත්තා. ඊට පස්සේ හොඳටම ගහපු මාමාගෙන් සමාව අරගෙන අඬ අඬා ගෙදර ගියා. ගම පුතා ඇඳට ගිහිල්ලා අක්කාට මුළු විස්තරේම කියලා බෙහෙත් ටිකක් ගාගත්තා. එහා ගෙදර මාමා ගහපු තැන්වලට.



හැමදාම වගේ ගමරාලගේ පවුල කුඹුරට ගිහින් ඇවිල්ලා නාන්න ඇළට යනවා, එක දවසක් කුඹුරට ගිහින් ඇවිල්ලා, අම්මා ඇදුම් ලෑස්ති කරද්දි ගම පුතා තනියම උදේ ලෑස්ති වෙලා ඇළට ගියා. අම්මා ලෑස්ති කර කර ඉදිද්දී පුතා හිටියේ නෑ, ඊට පස්සේ ගම පුතා ඇළට පැන්නා.



පැන්නා විතරයි ඇළේ  පතුළටම වැටුණා. ගෙදර හිටපු ගම දුව ඒ සිද්ධිය දැක්කා. ගම දුව ටිකක් බලාගෙන හිටියා, පතුලට පැන්න ගමන් පුතා උඩට එනවද නැද්ද කියලා, කාලය ගෙවී ගියා, අම්මයි තාත්තයි ගම පුතාව හොයනවා ගොඩක් වෙලා, ගම දුව ඇළ දිහා බලාගෙන හිටියා ඒත් ගම පුතා ඇළෙන්  උඩට ආවේ නෑ,  ගම දුව දුවගෙන ගිහිල්ලා අම්මටයි තාත්තටයි  කිව්වා.

මල්ලි ඇළේ ඉන්නේ මම දැන් ගොඩක් වෙලා බලන් හිටියා.  ඒත් මල්ලි උඩට අවේ නෑ. ගම දුවයි, ගමරාළයි, ගමහාමිනෙයි හනිකට දුවලා ගිහින් තුන් දෙනාම ඇළට පැනලා තුන් පොළකට ගිහින් හොයන්න පටන් ගත්තා, ගම දුවට ගම පුතාව හම්බ වුණා. ගම පුතා හොදටම බය වෙලා හිටියේ.

ගම දුවයි,අම්මයි,තාත්තයි පුතා ගොඩට අරන් ආවා. ගොඩක් වෙලා වතුරේ හිටපු නිසා ගම පුතාට හෙබ්රිස්සාව හැඳුණා. අම්මයි තාත්තයි ගියා ගම දුවට පුතා බලාගන්න කියලා බෙහෙත් ගන්න,  ගම පුතාගේ හෙම්බිරිස්සාවට,
අම්මා ගෙදර ආවා ගම දුව ඇහුවා  තාත්තා කොහොද ගියේ කියලා. අම්මා කිව්වා තාත්තා කුඹුරට ගියා බෙහෙත් ටික මට දීලා ගම පුතා බෙහෙත් බොන්න කැමති නෑ ඒක නිසා අම්මයි කල්පනා කරලා බෙහෙත් ටික  පොවා ගන්නේ කියලා.

අම්මයි ගම දුවයි කල්පනා කරලා ගම දුව කිව්වා අම්මේ මල්ලීට බෙහෙත් බොන්න උපක්‍රමයක් හොයාගත්තා, අම්මා කීවා මොකක්ද ඒ උපක්‍රමේ. ගමදුව කිව්වා මල්ලි හැමදාම කිරි බොන්න කුස්සියට එනවානේ  හෙට අපි කිරි වෙනුවට බෙහෙත් ටික දිය කරලා වීදුරුවක දාලා දෙමු මල්ලී මොනවද කරන්නේ කියලා. දවස ගෙවිලා ගියා.  උදේ මල්ලී  නිදාගෙන ඉන්න අතරේ  අම්මයි දුවයි බෙහෙත් ටික දිය කරලා වීදුරවට දාලා අම්මා පැත්තකට වෙලා බලන් හිටියා.මල්ලී මොකද කරන්නේ කියලා



මල්ලි කුස්සියට ආවා ඇවිල්ලා කිරි කියලා බෙහෙත් වීදුරුය අතට ගත්තා. අක්කගෙන් මල්ලී ඇහුවා අම්මා කෝ කියලා. අක්කා කිව්වා අම්මා කුඹුරට ගියා මල්ලි බෙහෙත් ටික බිව්වා. මල්ලිට කිරි එකේ වෙනසක් දැනුණා. හැබැයි මල්ලි කිරි එක බිව්වා.

මල්ලි දවස් කීපයක් බෙහෙත් බිව්වා. අම්මාගෙන් ගම පුතා ඇහුවා මේ දවස් ටිකේම බීපු කිරි ඉවරද කියලා. අම්මා කිවුවා ඒ කිරි ඉවරයි කියලා. අක්කා ඒවාබිවුවද නැද්ද කියලා ගම පුතාට දැන ගන්න ඕන වුණා. උත්සාහ කරා ගොඩක් සැරයක් හැබැයි එක සැරයක්වත් හරි ගියේ නෑ. අක්කා කිරි බිව්වද නැද්ද කියන උත්සාහය මල්ලි අතහැරලා දැම්මා.



එක දවසක් අක්කා ගෙදර ඉන්න අතරේ මල්ලී හොරෙන් ගෙදරින් පිටවලා ගියා. පාරේ යද්දී පොඩි ඇණයක් තිබ්බා. ඒ ඇණය ගම පුතාගේ කකුලේ ඇණුනා. කකුලේ ඇණය ඇණුනත් පොල් කඩාගන්න ඕන නිසා ඒ වේදනාව ඉවසාගෙන පොල් ගහ ගාවට ගියා.



ගහට නගින්න පටන් ගත්තා. පොල් ගෙඩි හතරක් පහක් කැඩුවා. කඩාගෙන යද්දි ගසෙන් ලිස්සලා බිමට වැටුණා. ඊට පස්සේ මුලු ඇගම රිදුණා. ගම පුතා අඬන්නට ගත්තා. පොල් ගහ ගාවට අක්කා දුවගෙන ආවා. ගම දුව මේ සිද්ධිය දැක්කා. අක්කට තරහ ගියා. හැබැයි ඒ තරහ අක්කා ගම පුතාගේ මූණට පෙන්නුවේ නැහැ. අක්කා මල්ලීව කුඹුරට එක්කන් ගියා. අම්මයි තාත්තයි ඉන්න තැනට අම්මයි තාත්තත් පුදුම වුණාත් පුතා කරපු මේ වින්නැහිය ගැන, ගම දුව තුන්දෙනාම පොල් ගහ ගාවට එක්කන් ගියා. ගමරාළ කිවා ගම හාමිනේටයි ගම දුවටයි පොල් ගහ ගාව තියෙන පොල් ගෙඩි ටික අහුලා ගෙදරින් තියලා එන්න ඔය දෙන්න ගිහින් එනකල් මම ගම පුතා බලා ගන්නම් ගම හාමිනෙයි ගම දුවයි ගමරාල පුතාව බලා ගන්නකල් පොල් ගෙඩි ගෙදරින් තියලා අපසු වත්තට ආවා.ඊට පස්සේ ගම පුතාව මොනවද කරන්නේ කියලා කල්පනා කළා.





තුන්දෙනාම ගම පුතාව අල්ලාගෙන ගෙදර එක්කන් ගියාම ගම පුතාව ගම දුවට බලාගන්න කියලා ගම හාමිනෙයි ගමරාලයි ගියා.

ගම දුව පුතාට කිව්වා මල්ලි මොකද අමාරු එහෙම නෑ නේද? ඔයා මොනවා හරි මල්ලිට හදලා දුන්නද ?නැහැ අම්මා මම පණිවිඩේ අහගෙන එද්දි මල්ලි පුටුවෙ හිටියේ නෑ කොහේ ගියාද දන්නේ නෑ අම්මේ මම මල්ලි හොයාගෙන අම්මට කියන්නම් ගම දුව කිව්වා.

ගම දූවට කෝපි හදන එක නවත්තලා මල්ලි හොයන්න පටන් ගත්තා ගම දුව හැමතැනම හෙව්වා.

ගම දුව වැසිකිළිය බලන්න බැරිවුනා ගම දුව වැසිකිලිය බලන්න ගියා වැසිකිළිය ඇතුළේ ගම පුතා හිටියා. ගම දුව ඇහුවා ඔයා කොහොමද ඇවිද්දේ. ගම පුතා කිව්වා මට ඇවිදින්න පුළුවන් එතකොට ඔයා අම්මටයි තාත්තටයි මටයි කළේ බොරුවක්ද ? මම දැන්ම අම්මටයි තාත්තට පණිවිඩයක් යවන්න ඕනෑ බෙහෙත් ගේන්න එපා කියලා ඔයා කරලා තියෙන්නේ බොරුවක් මම මේ දැන් දැනගත්තේ බෙහෙත් ගේන්න එපා කියලා.

අම්මා ඇහුවා මල්ලිව කොහේ ඉඳලද හම්බ වුණේ කියලා.ගම දුව කිව්වා වැසිකිලියේ ඉඳලා හම්බවුණේ මල්ලිට හොඳටම ඇවිදින්න පුළුවන්. මල්ලිට කිසිම අමාරුවක් නෑ. අම්මටයි තාත්තටයි හොඳටම තරහ ගියා පුතා කරපු මේ වැඩේට.

ගම රාළයි ගම හාමිනෙයි බෙහෙත් අරගෙන ඉවරයි බෙහෙත් ටික ආපහු දෙන්නත් බෑ දීපු බෙහෙත් ටික ගෙදර ගෙනාවා බෙහෙත් ගෙනාවට ගමන් පුතාට කිසිම ලෙඩක් නෑ.

ගම පුතා මිදුලට වෙලා සෙල්ලම් කර කර ඉන්නවා ගමරාළත් ගම හාමිනෙත් ගෙදර ආවට ගම පුතාට කතා කළේ නෑ. අක්කාත් මල්ලිට කතා කළේ නෑ



අක්කටත් හොඳටම තරහ ගිහින් එයා අම්මයි තාත්තයි ගෙදර එනකල් හිටියේ. තාත්තා ගම පුතා කුස්සිය පැත්තේ හෙව්වා. අම්මා සාලය වටේ හෙව්වා.අක්කා වැසිකිලිය ඇතුලේ හෙව්වා. තුන්දෙනාම හැම තැනම හොයලා බැලුවා ගම හාමිනේට හිතුණා අපිට එක තැනක් මඟ හැරුණා කියලා.

තුන් දෙනාටම තරහ ගිහින් හොඳටම, ගම හාමිනේ ගම පුතාගෙන් එක එක ප්‍රශ්න ඇහුවා. පුතා එක ප්‍රශ්නයකටවත් උත්තර දුන්නේ නෑ. ගමරාළ කිව්වා දැන් මේක වෙලා ඉවරයිනේ ඒ නිසා අපි යමු වැඩක් කරගන්න කුඹුරට, ගමහාමිනේ ප්‍රශ්න අහන එක නවත්තලා ගියා කුඹුරට වැඩ කරන්න. අක්කා ගියා කුස්සියට , මල්ලීට හදහද හිටපු කෝපි එක බොන්න..

පුතා කාමරයෙන්එළියට ආවා. පුටුවේ ඉදගෙන නිකන් හිටියා. අක්කා කෝපි එක බොනකල් ළගම හිටියා. එක පාරටම කුඹුරේ පැත්තෙන් ලොකු සද්දයක් ඇහුණා. ඒ සද්දේ නිකං කවුදෝ කෑගහන සද්දයක්. ගම දුවයි ගම පුතයි හනි හනිකට කුඹුරට ගොස් තාත්තාගෙන් ඇහුවා. මොකක්ද ඒ සද්දේ කවුද ඒ කැගැහුවේ. තාත්තා කිව්වා පොඩ්ඩක් බලන්නකෝ කියලා.

ගම දුවයි පුතයි දෙන්නම එක හඬින් කීවා කවුද මේක කරේ අපි දෙන්නා නිසාද නැත්නම් වෙන කෙනෙක් නිසාද මෙහෙම වුණේ. තාත්තා වුණ  සිද්ධිය කියන්න පටන්ගත්තා මම කුඹුරේ වැඩ කර කර හිටියා. මම දැක්කා අම්මා ඇඹුල අරන් එනවා. අම්මා එනකල් මම වැඩ කරා. එකපාරටම කවුදෝ කෑ ගහනවා ඇහුණා. ඇඹුල තිබ්බේ නෑ අම්මා හිටියෙත් නෑ මම ගියා ඒ කෑ ගහන සද්දේ ඇහුණ තැනට. එතකං අම්මා බිම වැටිලා හිටියා. මම පොඩ්ඩක් වට පිටාව බැලුවා. අම්මාගේ දකුණු කකුළ  ගාවපොඩි නයි පැටියෙක් ඒ නයි පැටියා ගාව කුරුමානම් අල්ලනවා හැබැයි පූසාට ඒ වැඩේ  කරගන්න බැරි වුණා. තුන්දෙනාම හොදටම අඩන්න පටන් ගත්තා. ගම දුව අඩ අඩා කිව්වා මෙහෙම දෙයක් ඉක්මනට අපි අම්මා ගෙදර ඇරන් යමු. මේ නයා අපිටත් අම්මාට වුණා වගේ දෂ්ඨ කරලා අපිව මරලා දායි. තුන්දෙනාම අඩ අඩා අම්මාව ගෙදර අරන් ගියා,  අම්මා ගෙදර රැගෙන යන විටත් මිය ගිහින් හිටියේ,ඊට පසු සියලු දෙනාම එකතු වී මළ ගෙදර වැඩ කටයුතු අවසන් කළා

ගමරාළගේ දරුවන් දෙදෙනා හැමදාම පාසල් ගිහින් හොඳට ඉගෙනගත්තා. ගම පුතාත් කම්මැලි කම අත ඇරලා තුන්දෙනාම කුඹුරේ වැඩ කරලා දියුණු වුණා. ගමරාළගේ කුඹුර සැරුසාර වී පවුලම සතුටින් කාලය ගත කළා.

සමාප්තයි



## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි  බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා  වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ  ඵලදායීතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ  එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ  ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත්  සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන්  වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන්  ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්